**04-04-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් වඩාත්ම ශ්‍රේෂ්ඨ මානවයන් වීමට උත්සාහ දරනවා. දේවතාවන් පිවිතුරු නිසා, ඔවුන් වඩාත්ම ශ්‍රේෂ්ඨ මානවයන් ලෙස හැඳින්වෙයි. ඔබ දැන් පිවිතුරු වෙමින් සිටිනවා.

**ප්‍රශ්නය:** අසීමිත පියා, දරුවන් වන අපට, සරණ ලබා දී තිබෙන්නේ ඇයි?

**පිළිතුර:** අප සියලු දෙනාම කුණු කූඩයේ සිටි නිසා. පරම පියා අපව කුණු කූඩයෙන් පිටතට ගෙන, අපව ලස්සන කරවයි. රකුසු ගති ඇති අයව ඔහු දිව්‍යමය ගුණදම් ඇති අය බවට පත් කරවයි. නාටක සැලසුමට අනුව, පරම පියා අපව කසල ගොඩෙන් ඉවතට ගෙන, අපව දරුකමට හදාගෙන, අපව ඔහු සතු කර ගත්තා.

**ගීතය:** අරුණෝදයේ පැමිණියේ කවුරුන්ද?

ඕම් ශාන්ති. රැය, දහවල බවට පරිවර්ථනය කිරීමට, පරම පියා පැමිණිය යුතුයි. පරම පියා දැන් පැමිණ ඇති බව, ඔය දරුවන් දන්නවා. පෙර කල, අප ශුද්‍ර වංශයට අයත්ව සිටි විට, අපට තිබුණේ ශුද්‍ර බුද්ධිය. බහු රූපී පිළිරුව, අන් අයට පහදා දීමට, ඉතා හොඳයි. ඔබ මෙම වංශයන්ගේ චක්‍රය වටා යන්නේ කෙසේද කියා ඔය දරුවන් දන්නවා. පරම පියා, පරමාත්ම ජීවය, අපව දැන් ශුද්‍රයින්ගෙන් බ්‍රහ්මනයන් බවට පරිවර්ථනය කර ඇත. අප සෑම කල්පයකම සංගමයේ බ්‍රහ්මනයන් වෙනවා. වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීව ලෙස බ්‍රහ්මණයන් හැඳින්වෙන්නේ නැහැ. වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීව ලෙස හැඳින්වෙන්නේ දේවතාවන් පමණයි. වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීව බවට පත්වීමට, බ්‍රහ්මනයන් මෙහිදි උත්සාහ දරමින් සිටිනවා. මිනිසුන් පරම පියාට යදින්නේ අපවිත්‍ර බවින් පිවිතුරු බවට පරිවර්ථනය වීම සඳහාය. එබැවින් ඔබ තමන්ගෙන් විමසිය යුතුයි: මා කෙතරම් දුරට පිවිතුරු වෙනවාද? ශිෂ්‍යයන්ද තම පාඩම් ආවර්ජනය කරයි. ඔවුන්ගේ ඉගෙනුම තුළින්, ඔවුන් කවුරු බවට පත් වෙයිද කියා ඔවුන්ට වැටහෙයි. ඔබ බ්‍රහ්මනයන් වී තිබෙන්නේ දේවතාවන් වීමට කියා, ඔය දරුවන්ගේ බුද්ධියේ දැන් තිබේ. ඔබ පරමාත්ම දෙවියන්ගේ දරුවන් නිසා මෙය ඔබගේ වඩාත්ම වටිනා ජීවිතයයි. පරමාත්ම දෙවියන් ඔබට රාජයෝගාව උගන්වනවා: ඔහු ඔබව අපවිත්‍ර බවින් පිවිතුරු බවට පරිවර්ථනය කරනවා. ඔබ පිවිතුරු දේවතාවන් බවට පත් වනවා. වංශ විස්තර කර දීම ඉතා හොඳයි. සන්‍යාසීන් මෙම කරුණ සමග එකඟ නොවන නමුත් උපත් 84හි ගණනය කිරීම ඔවුන්ට වැටහෙනවා. අත්හැරීමේ ආගමට අයත් ඔවුන්, උපත් 84ක් නොගන්න බවත් ඔවුන්ට වටහා ගත හැක. ඉස්ලාමිකයන් සහ බෞද්ධයින් ආදීන් උපත් 84ක් නොගන්නා නමුත්, එයට අඩු උපත් ගණනක පුනරුත්පත්ති ගන්නා බව, ඔවුන්ට වටහා ගත හැක. ඔබ ඔවුන්ට පහදා දෙන විට ඔවුන්ට විගසින් වටහාගැනීමට හැකි වෙයි. ඔවුන්ට විස්තර කරන විට ඔබ උපායශීලී විය යුතුයි. වෙනත් දරුවන්ද නැවුම් වීමට මෙහි පැමිණෙන ආකාරයෙන්, මෙහි පෞද්ගලිකව අසුන්ගෙන සිටින ඔය දරුවන්ගේ බුද්ධිද, බාබා නැවුම් කරවයි. බාබා දිනපතාම මෙසේ පවසමින් ඔබව නැවුම් කරවයි : මෙම දේවල් ධාරණය කරගන්න. අපි උපත් 84ක් ගන්නේ කෙසේද සහ අපි ශුද්‍රයන්ගෙන් බ්‍රහ්මනයන් වුණේ කෙසේද, ගැන පමණක් ඔබගේ බුද්ධියෙන් නොකඩවා සිතිය යුතුයි. බ්‍රහ්මනයන් බ්‍රහ්මාගේ දරුවන්ය. දැන් බ්‍රහ්මා පැමිණියේ කොහේ සිටද? පරම පියා විස්තර කරන්නේ : මා මේ කෙනාට බ්‍රහ්මා යන නම තබනවා. ඔය සියලුම බ්‍රහ්ම කුමර කුමරියන්, පවුලක්ය. එබැවින්, ඔබ නිසැකවම දරුකමට හදා ගන්නට ඇති. ඔබව දරුකමට හදා ගන්නේ පරම පියා පමණයි. ඔහුව අමතන්නේ දාදා(සහෝදරයා) ලෙස නොව, පියා කියාය. පියා ලෙස හැඳින්විය හැක්කේ, පරම පියාව පමණයි. ඔබට පියාගෙන් දේපළ හිමිවෙයි. ඇතැම් විට බාප්පා කෙනෙක්, මාමා කෙනෙක් හෝ එම පවුලේම කෙනෙක් දරුවෙක්ව දරුකමට හදා ගනී. වරක් කෙනෙකුට, කුණු කූඩයක සිටි කුඩා ළදැරියක් හමු වූ අතර ඇයව එළියට ගෙන තමන්ගේම දරුවෙක් නොසිටි යුවලකට ඇයව දරුකමට හදාගැනීමට දුන් අන්දම ගැන, පරම පියා ඔබට පවසා ඇත. එම දරුවා, ඇයව හදාගත් යුවලට අම්මා, තාත්තා කියා අමතයි, එහෙම නේද? මෙහි, එය අසීමිත බව පිළිබඳ කරුණකි. ඔය දරුවන් අසීමිත කුණු කූඩයේ සිටියා වැනිය. ඔබ වැතිරී සිටියේ විෂ ගංගාවේ; ඔබ බොහෝ අපිරිසිදුව වැතිරී සිටියා! නාටකයට අනුව පරම පියා පැමිණ, ඔබව කසල ගොඩෙන් ඉවත් කර ඔබව දරුකමට හදාගත්තා. තමෝප්‍රධාන් ලෝකය හැඳින්විය හැක්කේ කසල යනුවෙන් පමණයි. රකුසු ගති ඇති මනුෂ්‍යයන් සිටින්නේ ශරීර අවධානයෙන්ය. රාගයේ සහ කෝපයේ අවගුණ අති මහත්ය. ඔබ සිටියේ රාවනගේ විශාල කුණු කූඩයේය. ඇත්ත වශයෙන්ම ඔබත් සරණාගතයින්.

ඔබ දැන් පියාගේ සරණ පතා ඇත්තේ, කුණු කූඩයෙන් ඉවතට පැමිණ, ලස්සන දේවතාවන් වීමටයි. වර්තමානයේ මුළු ලෝකයේ සිටින සියලුම දෙනා ඉන්නේ විශාල කුණු කූඩයක් තුළයි. පරම පියා පැමිණෙන්නේ ඔබව කසල වලින් ඉවත් කර ඔබව ඔහු සතු කර ගැනීමටයි. කෙසේවෙතත්, කසල ගොඩේ ජීවත් වෙමින් සිටි අය එයට කෙතරම් පුරුදු වී සිටින්නේද, ඔවුන්ව ඉන් පිටතට ගත් විටත්, ඔවුන් වැඩි කැමැත්තක් දක්වන්නේ කසල වලටයි. පරම පියා පැමිණ සිටින්නේ ඔබව අසීමිත කුණු කූඩයෙන් ඉවත් කිරීමටයි. මිනිසුන් මෙසේ කන්නලව් ද කරයි බාබා, ඇවිත් අපව ලස්සන කරන්න! අපව මෙම කටු කැලෑවෙන් ඉවත් කර අපව මල් බවට පත් කරන්න. අපව දෙවියන්ගේ උද්‍යානයේ හිඳුවන්න. වර්තමානයේ අප ඉන්නේ රකුසන්ගේ කැලෑවේය. පරම පියා ඔය දරුවන්ව ඔහුගේ උයනට ගෙන යයි. ඔබ දැන් ශුද්‍රයන්ගෙන් බ්‍රහ්මනයන් බවට පත් වී ඇති අතර ඔබ දේවතාවන් වීමට යනවා. එය බ්‍රහ්මනයන්ගේ නොව, දේවතාවන්ගේ රාජධානිය වීමට තිබේ. ඔබ පාණ්ඩවයන් ලෙස හැඳින්වෙන නමුත් ඔය පාණ්ඩවයන්ට රාජධානියක් නැත. ඔබ පියා සමග අසුන්ගෙන සිටින්නේ ඔබගේ රාජධානිය හිමි කරගැනීමටයි. අසීමිත රාත්‍රිය දැන් අවසන් වන අතර අසීමිත අරුණෝදයේ උදාව අත ළඟය. ඔබට ගීතය ඇසුණා: හිමිදිරි උදයේ පැමිණියේ කවුරුන්ද? ඔහු හිමිදිරි උදෑසනින් පැමිණෙන්නේ රාත්‍රිය අවසන් කිරීමට සහ අරුණ උදා කිරීමටයි. මින් අදහස් වන්නේ ඔහු පැමිණෙන්නේ දෙව්ලොව ස්ථාපිත කිරීමට සහ නිරය විනාශ කරවීමටයි. මෙය පමණක් ඔබගේ බුද්ධියේ රැඳී තිබුණත් ඔබට සතුටින් සිටිය හැක. නව ලෝකයේ උසස් තත්ත්වයක් හිමි වීමට තිබෙන අය, ඔවුන්ගේ රකුසු ගති කිසි විටෙකත් නොපෙන්වයි. ඔවුන් විශාල සෙනෙහසකින් යග්යාවට සේවය කරන අතර, එමගින් ඔවුන් බොහෝ ශ්‍රේෂ්ඨත්වයට පත් වෙයි. ඔබ මෙම යග්යාවට ඔබගේ ඇට මිදුළු පවා පිදිය යුතුයි. තමන්ව පරීක්ෂා කරන්න: මා මේ ආකාරයෙන් හැසිරෙන්නේ නම්, මා උසස් තත්ත්වයක් හිමි කරගන්නේ කෙසේද? ඔබ තව දුරටත් අනුචණ කිරි සප්පයින් නොවෙයි. ඔබ රජෙක් හෝ පුරවැසියන්ගෙන් කොටසක් වන්නේ කෙසේද කියා, ඔබටම වටහා ගත හැක. බාබා ගෙන ඇත්තේ, රජවරුන් ආදිය හොඳින් හැඳින සිටි, අත්දැකීම් ඇති රථයකි. රජවරුන්ගේ දාසියන් සහ සේවකයන්ට පවා බොහෝ සතුට ලැබෙයි. ඔවුන් ජීවත් වන්නේ රජවරු සමගයි, නමුත් ඔවුන් හඳුන්වන්නේ දාසියන් සහ සේවකයන් ලෙසයි. ඔවුන් සතුටින් සිටින අතර රජු සහ රැජින කන කෑම ඔවුන්ද කයි. මාලිගාවෙන් පිටත ජීවත් වන අයට එම කෑම නොලැබෙයි. දාසියන්ටද එය අංකානුරූපයි. සමහරු රැජිනව සරසයි, සමහරු දරුවන් රැක බලා ගනී, තවත් අය බිම අතුගායි. වත්මන් රජවරුන්ට බොහෝ දැසි දාසයන් සිටියි. එබැවින් එහි කොපමණ සිටියිද කියා ටිකක් සිතා බලන්න! ඔවුන් සියලු දෙනාම තම තමන්ගේ විවිධ කොට්ඨාශ භාරව සිටියි. ඔවුන්ගේ වාසස්ථාන වෙනම තිබෙයි. ඔවුන් රජු හා රැජින තරම් සැරසී සිටින්නේ නැහැ. ඔවුන් මාලිගාව ඇතුලට එන නමුත්, ඔවුන් වාසය කරන්නේ සේවකයන්ට වෙන්වූ නිල නිවාස වලයි. එබැවින් පරම පියා ඉතා පැහැදිලිව විස්තර කර දෙයි : ඔබ උසස්ම උසස් වන ආකාරයට තමන් වෙනුවෙන් සානුකම්පිත වන්න. ඔබ දැන් ශුද්‍රයන්ගෙන් බ්‍රහ්මනයන් බවට පත් වී සිටියි. මෙය ඔබට විශාල භාග්‍යයක්; ඔබ දේවතාවන් වෙයි. මෙම සංගම යුගය බොහෝ යහපත සලසන්නක්. ඔබට සෑම කරුණකින්ම අත්වන්නේ යහපතක්මයි. ඔබ යෝගා ස්ථිතියක රැඳී සිටිමින් මුළුතැන්ගෙයි ආහාර පිළියෙල කරන විට, බොහෝ දෙනෙකුට සෙතක් සිදුවෙයි. ශ්‍රීනාත් ද්වාරා දේවාලයේ ඔවුන් ආහාර පිළියෙල කරන්නේ සම්පූර්ණ නිහැඬියාවේ සිටිමින්ය. ඔවුන් සිහි කරන්නේ ශ්‍රීනාථව පමණයි. බැතිමතුන් ඔවුන්ගේ භක්තියේ බොහෝ නියැළී සිටියි. ඔබ මෙම ඥානයෙන් කුල්මත් වී සිටිය යුතුයි. ක්‍රිෂ්ණා වෙනුවෙන් ඔවුන් දැඩි භක්තියේ යෙදෙයි, ඒ ගැන අහන්නවත් එපා! කුඩා දරුවන් දෙදෙනෙක් වරින්දාවන්හි (ක්‍රිෂණාගේ වනය) වාසය කිරීමට පිටත්ව ගියා. ඔවුන් ක්‍රිෂ්ණාගේ දැඩි බැතිමතුන් විය. ඔවුන් වාසය කරන්නේ එහි පමණක් බවත්, ඔවුන් එහිදී ක්‍රිෂ්ණාව සිහි කරමින් තම සිරුරු හැර යන බවත් පැවසීය. හොඳ නිවසක වාසය කර, දැනුම ලබා ගන්නා ලෙස ඔවුන්ට බොහෝ වාර ගණනාවක් ආරාධනා කළ මුත්, ඔවුන්ට වාසය කිරීමට අවශ්‍ය එහි පමණක් බව ඔවුන් කියා සිටියා. ඔවුන් උසස්ම බැතිමතුන් ලෙස හැඳින්විය හැක. ඔවුන් ක්‍රිෂ්ණා වෙනුවෙන් සම්පූර්ණයෙන් කැප විය. ඔබ දැන් තමන්ව පරම පියාට කැප කළ යුතුයි. ආරම්භයේ බොහෝ දෙනෙක් ශිව බාබාට කැප විය. බොහෝ දෙනෙක් පැමිණි නමුත් අප ඉන්දියාවට මාරු වූ විට, බොහෝ දෙනෙකුට තම නිවෙස් සහ පවුලේ අය මතක් වී පිටව ගියා. බොහෝ දෙනෙක් මත රාශි වල බලපෑම් තිබේ. ඇතැම් විට එක් අන්දමක රාශිද, තවත් විටෙක තව ආකාරයක රාශි වල බලපෑම්ද තිබේ. පැමිණෙන සෑම කෙනෙකුගෙන්ම මෙසේ විමසීමට කියා, බාබා ඔබට පවසා තිබේ: ඔබ ආවේ කොහාටද? ඔබ පිටත 'බ්‍රහ්ම කුමර කුමරියන්' කියා ලියා ඇති පුවරුව දුටුවාද? මෙය පවුලක්. එක්කෙනෙක් අශාරීරික පරම පියා, පරමාත්ම ජීවය වන අතර, අනෙක් කෙනාව සිහි කර තිබෙන්නේ ප්‍රජාපිතා බ්‍රහ්මා ලෙසයි. මේ සියලු දෙනාම ඔහුගේ දරුවන්ය. ශිව බාබා දාදාය(සීයා). අපට අපගේ දායාදය හිමි වන්නේ ඔහුගෙනි. ඔහු මෙම අවවාදය ලබා දෙයි : මා සිහි කරන්න,

එවිට ඔබ අපවිත්‍ර බවින් පිවිතුරු වෙයි. ඔහු පෙර කල්පයේද මෙම අවවාදයම ලබා දුන්නා. මෙය බොහෝ ශ්‍රේෂ්ඨ ඉගෙනුමකි. ඔබට ඔබගේ පියාගෙන් දායාදය හිමි වන බව, ඔබගේ බුද්ධියෙන් වැටහෙයි. ඔය දරුවන් මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වීමේ අධ්‍යයනය ඉගෙන ගන්නවා. එබැවින් ඔබ අනිවාර්යයෙන්ම දිව්‍යමය ගුණදම් ධාරණය කරගත යුතුයි. ඔබගේ ආහාර පාන මෙන්ම ඔබගේ වචන සහ හැසිරීම බොහෝ රාජකීය විය යුතුයි. දේවතාවන් කන්නේ ඉතා අඩුවෙනි. ඔවුන් කිසි දේකට වසඟ වන්නේ නැහැ. ඔවුන් වෙනුවෙන් ආහාර වර්ග තිස් හයක් පිළියෙල කෙරෙන නමුත් ඔවුන් කන්නේ ඉතා අඩුවෙන්ය. ආහාර පාන වලට වසඟ වීම රකුසු හැසිරීමකි. ඔබ දිව්‍යමය ගුණදම් ධාරණය කරගත යුතුයි, එබැවින් ඔබගේ කෑම බීම ඉතා පිවිතුරු සහ සරළ විය යුතුයි. කෙසේවෙතත්, මායා කෙබඳු වන්නේද යත් ඇය ඔබගේ බුද්ධිය සම්පූර්ණයෙන් ගල් බවට පත් කරවයි. එබැවින් ඔබට එයට අනුකූල තත්ත්වයක් හිමි වෙයි. පරම පියා පවසන්නේ : තමන්ට යහපතක් සිදු කිරීමට, දිව්‍යමය ගුණදම් ධාරණය කරගන්න. ඔබ හොඳින් ඉගෙන ගෙන අන් අයට උගන්වන්නේ නම්, ඔබට තිළිණයක් ලැබෙයි. මෙය ලබා දෙන්නේ පරම පියා නොවෙයි; ඔබ එය හිමි කරගන්නේ ඔබගේම උත්සාහයන් මගින්ය. ඔබ කෙතරම් දුරට සේවය කරනවාද, එමෙන්ම ඔබ කවුරුන් බවට පත් වෙයිද කියා, තමන්ව පරීකෂා කර බලන්න. ඔබ මේ මොහොතේ ඔබගේ සිරුර හැර යන්නේ නම්, ඔබට කුමක් ලැබෙයිද? ඔබගෙන් කිසිවෙකු බාබාගෙන් මෙය විමසන්නේ නම්, බාබා සැනෙකින් මෙසේ කියයි: ඔබගේ මෙම ක්‍රියාකාරකම් නිසා, ඔබ කුමන තත්ත්වයක් හිමි කරගනීවිද කියා වටහාගත හැක. ඔබ උත්සාහ නොදරන්නේ නම්, ඔබ සෑම කල්පයකම තමන්ට පාඩුවක් අත් කරගනිවි. හොඳින් සේවය කරන අය නිසැකවම හොඳ තත්ත්වයක් හිමි කරගනී. දාසියන් සහ සේවකයන් වීමට යන්නේ කවුරුන්ද කියා ඇතුලතින් වැටහෙයි. මෙය හඬ නගා නොකියනු ඇත. ඔවුන් ජ්‍යෝෂ්ඨයින් වෙයිද, කණිෂ්ඨයින් වෙයිද කියා, පාසැලේ ශිෂ්‍යයන්ට වටහාගත හැක. මෙහිදීද එය එසේමයි. ජ්‍යෝෂ්ඨ අය රජවරුන් සහ රැජිනියන් වන අතර කණිෂ්ඨයින් අඩු තත්ත්වයක් ලබා ගනී. ධනවතුන් අතරේ ජ්‍යෝෂ්ඨයින් සහ කණිෂ්ඨයින් සිටින අතර දාසයන් සහ සේවකයන් අතරේද ජ්‍යෝෂ්ඨයින් සහ කණිෂ්ඨයින් සිටියි. ජ්‍යෝෂ්ඨයින්ගේ තත්ත්වය උසස්ය. අතුගාන සේවිකාවකට මාලිගාවට ඇතුළු වීමට අයිතියක් නැත. ඔය දරුවන්ට මේ සියලු දේවල් ඉතා හොඳින් වටහාගැනීමට හැකි අතර අවසානයේ ඔබට ඊටත් වඩා හොඳින් වැටහෙයි. ශ්‍රේෂ්ඨත්වයට පත් වූ අයට ඔබ ගරු කළ යුතුයි. කුමාරිකා දෙස බලන්න, ඇය ජ්‍යෝෂ්ඨයෙක්, එබැවින් ඇයට ගරු කළ යුතුයි. පරම පියා ඔය දරුවන්ගේ අවධානය මෙයට යොමු කරවනවා: මහාරති දරුවන්ට ගරු කරන්න. ඔබ ගරු නොකරන්නේ නම්, ඔබ තමන් මත ඇති පාපයේ බර වැඩි කරගන්නවා. මේ සියලු දේට පරම පියා ඔබගේ අවධානය යොමු කරනවා. ඔබ සියලු දෙනාට, අංක පිළිවෙලට ගෞරවය ලබා දෙන්නේ කෙසේද ගැන, ඔබ බොහෝ ප්‍රවේසම් විය යුතුයි. බාබා සියලුම දෙනා ගැන දන්නවා. ඇතැමුන්ට යමක් පවසන්නේ නම්, ද්‍රෝහීන් වීමට ඔවුන්ට වැඩි කලක් ගත වන්නේ නැත. කුමාරීන් සහ මව්වරුන් මත බන්දන ද තිබේ; ඔවුන්ට බොහෝ දරා ගැනීමට සිදුවෙයි. වැඩිපුරම මෙසේ ලියන්නේ මව්වරුන්: බාබා, මේ කෙනා මට බොහෝ කරදර දෙනවා. මා කළ යුත්තේ කුමක්ද? කෙසේවෙතත්, ඔහු ඔබට බලහත්කාරකමක් කිරීමට තරම්, ඔබ තිරිසන් සතෙක් නොවෙයි. ඔබගේ හදවත තුළ යම් ආශාවක් ඇති. ඔබ විමසන්නේ එනිසයි. මෙහි විමසීමට කිසිවක් නැත. ජීවාත්මයක්, තමන්ගේම සතුරා මෙන්ම තමන්ගේම මිතුරාය. ඔබට කැමති දෙයක් කළ හැක. ඔබ ඒ ගැන විමසන්නේ ඔබගේ හදවතේ යම් ආශාවක් තිබෙන නිසයි. ප්‍රධානතම දේ සිහි කිරීමය. ඔබට පිවිතුරු විය හැකි වන්නේ සිහි කිරීම තුළින්ය. ලකෂ්මි සහ නාරායන් අංක එකේ පිවිතුරු අයයි. මමා බොහෝ සේවය සිදුකළා` ඔබගෙන් කිසිවෙකුට, ඔබ මමාට වඩා දකෂ බව කිව නොහැක. දැනුම අතින් සියල්ලටම වඩා නුවණැති කෙනා මමාය. බොහෝ දෙනෙක් යෝගාවේ දුර්වලයි; ඔවනුන්ට සිහි කිරීමේ සිටිය නොහැක. ඔබ බාබාව සිහි නොකරන්නේ නම්, ඔබගේ පාපයන් දුරු වන්නේ කෙසේද? නීතිය පවසන්නේ, අවසානයේ ඔබ තම සිරුර අත්හැරිය යුත්තේ සිහි කිරීමේ සිටිමින්ය. ඔය ජීවාත්ම ඔබගේ සිරුරු අත්හැරිය යුත්තේ ශිව බාබාගේ සිහි කිරීමේ සිටින අතරයි. වෙනත් කිසිවෙක් නොව, සිහිකළ යුත්තේ, ඒකායන පියාව පමණයි. කිසි දේකට ආකර්ශණයක් නොතිබිය යුතුයි. මෙය පුහුණු විය යුතුයි. අප අශාරීරිකව පැමිණි අතර අප ආපසු යා යුත්තේද අශාරීරිකවයි. බාබා නැවත නැවතත් ඔය දරුවන්ට පවසන්නේ : බොහෝ සේ මිහිරි වන්න. එමෙන්ම දිව්‍යමය ගුණදම් ධාරණය කරගන්න. දැන් ශරීර අවධානයේ නපුරු භූතයන් සිටියි. තමන් කෙරෙහි බොහෝ අවධානය යොමු කරන්න. අන් අය සමග බොහෝ සෙනෙහසින් සම්බන්ධ වන්න. පරම පියා සිහිපත් කර, චක්‍රය භ්‍රමණය කරන්න. සියලු දෙනාටම චක්‍රයේ රහස් විස්තර කර දෙන්න, එවිට ඔවුන් විශ්මයට පත් වෙයි. කිසිවෙකුට උපත් 84 සිහි කළ නොහැකි බැවින් උපත් මිලියන 8.4ක් කිසිවෙකුට සිහි වන්නේ කෙසේද? එය කිසිවෙකුගේ සිතට පවා ඇතුළු විය නොහැක. ඔබ මෙම චක්‍රය පමණක් ඔබගේ බුද්ධියේ තබාගත්තත්, එය මහා භාග්‍යයකි. මෙම නාටකය

දැන් අවසන් වනවා. පැරණි ලෝකය පිළිබඳ නිරාශාවක් තිබිය යුතුයි. ඔබගේ බුද්ධියේ යෝගාව නිහඬ දේශයට සහ සතටු දේශයට යා යුතුයි. ගීතාවේ

'මන්මනාභව' සඳහන් වී ඇත. ගීතාව හදාරන කිසිවෙක් 'මන්මනාභව'හි නිවැරදි අරුත නොදනී. ඔය දරුවන් එය දන්නවා. පරමාත්ම දෙවියන් පවසයි : සියලුම ශාරීරික නෑදෑයන් අතහැර තමන් ජීවාත්ම බව සලකන්න. මෙසේ පැවසුවේ කවුරුන්ද? ක්‍රිෂ්ණා, දෙවියන් නොවෙයි. ඇතැමුන් පවසන්නේ, ඔවුන් ග්‍රන්ථ ශාස්ත්‍ර පමණක් විශ්වාස කරන බවයි. දෙවියන් පැමිණියත් ඔවුන් ඔහුව විශ්වාස නොකරයි. ඔවුන් නොකඩවා ශාස්ත්‍ර නිවැරදිව හදාරයි. පරමාත්ම දෙවියන් පැමිණ රාජයෝගාව උගන්වයි. ස්ථාපනය දැන් සිදුවෙමින් පවතිනවා. මේ සියලුම ශාස්ත්‍ර ආදිය අයත් වන්නේ භක්ති මාර්ගයටයි. මේ සිටින්නේ පරමාත්ම දෙවියන්ය, යන විශ්වාසය ඔවුන්ට තිබුණේ නම්, ඔවුන් විසින් උරුමය හිමි කරගැනීම අරඹනු ඇත. එවිට, භක්තිය පවා ඉගිල යනු ඇත. කෙසේවෙතත්, මෙය විය හැකි වන්නේ, ඔවුන්ට මෙම විශ්වාසය තිබෙන විට පමණයි. අච්ඡා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. දේවතාවන් වීම සඳහා බොහෝ රාජකීය සංස්කාර ධාරණය කරගන්න. ඔබගේ ආහාර පාන ඉතා පිවිතුරු සහ සරළ විය යුතුයි. වසඟ නොවන්න. තමන්ට සෙතක් සලසා ගැනීමට දිව්‍යමය ගුණදම් ධාරණය කරගන්න.
2. තමන් කෙරෙහි අවධානය යොමු කර, සියලු දෙනා සමග බොහෝ සෙනෙහසින් යුතුව සබැඳියාවන් පවත්වන්න. ඔබට වඩා ජ්‍යෙෂ්ඨ අයට ගරු කරන්න. බොහෝ මිහිරි වන්න. ශරීර අවධානයට පත් නොවන්න.

**වරදානය:** අන් අය කෙරෙහි ඔබට පිරිසිදු හා ධනාත්මක සිතිවිලි ඇතිව, දයානුකම්පිත වීමෙන්, අතීතයේ ඕනෑම දෙයක් යටපත් කරන්න.

යමෙක් කෙනෙකුගේ අතීත දුර්වලතා ගැන ඔබට පැවසීමට ඔබ වෙත පැමිණෙන විට, සුබ පැතුම් සමඟ පසෙකට වන්න. කිසිදු නිෂ්ඵල සිතිවිල්ලක් හෝ දුර්වලතා ගැන කතා නොකරන්න. කරුණාවන්ත වී අතීතයේ දෙයක් යටපත් කරන්න. ඒ දේවල් යටපත් කර ඔබේ මනසෙහි සුබ පැතුම් සමඟ එම ආත්මයට සේවය කිරීම දිගටම කරගෙන යන්න. යමෙකු තම සංස්කාරවල බලපෑම නිසා වැරදි දෙයක් කියනවා නම්, කරනවා නම් හෝ සවන් දෙනවා නම්, එය පරිවර්තනය කරන්න. මේ ආකාරයෙන් එක සිට දෙක දක්වා හෝ තුන දක්වා ඒවා පතුරුවා හැරීමෙන් කිසිදු නාස්තිකාර කාරණයක ජපමාලයක් නිර්මාණය වීමට ඉඩ නොදෙන්න. එවැනි අවධානයක් යොමු කිරීම යනු පිරිසිදු හා ධනාත්මක සිතිවිලි ඇති කර ගැනීමයි.

**පාඨය:** තෘප්තියේ මැණිකක් වන්න, එවිට ඔබට පරමාත්ම දෙවියන්, මිනිසුන් සහ ඔබම ආදරය කරාවි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඒකාබද්ධ ස්වරූපයේ අවධානයෙන් නිරන්තරයෙන් ජය ලබන්න.**

ජීවාත්මයක් සහ ඔහුගේ සිරුර යන දෙක ඒකාබද්ධ වූ විට ජීවිතයක් තිබේ, එමෙන්ම එම ජීවාත්මය, ඔහුගේ සිරුරින් වෙන් වන්නේ නම්, ජීවිතය අවසන් වෙයි. ඒ අන්දමින්ම කර්ම යෝගී ජීවිතයක් යනු, යෝගාව නොමැතිව ක්‍රියාවක් නොමැති අතර ක්‍රියා නොමැතිව යෝගාවත් නොමැත. නිරන්තරයෙන් ඒකාබද්ධව රැඳී සිටින්න, එවිට ඔබට නිරතුරුවම සාර්ථකත්වය අත්වෙයි.